**ශීර්ෂය 283 - වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව**

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

ශීර්ෂය 283 - වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ 2023 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අදාළ තොරතුරු ද ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන් වලින් සමන්විත 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් ඇතුළත් සම්පිණ්ඩන වාර්තාව 2024 ජූනි 25 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවට අදාළ වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2024 ජූලි 12 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2023 දෙසැම්බර් 31 දිනට වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශය සම්බන්ධයෙන් ගණන්දීමේ නිලධාරීගේ වගකීම

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුව විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකාධිපති වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මග හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරිම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ගණන්දීමේ නිලධාරී දැනුවත් කරන ලදී.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඇ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වන බවට,

(ආ) ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මා විසින් කර තිබුණු පහත සඳහන් නිර්දේශ ක්‍රියාත්මක කර නොතිබුණි.

| ඉකුත් වර්ෂයට අදාළ වාර්තාවේ ඡේද යොමුව | ක්‍රියාත්මක කර නොතිබූ නිර්දේශය | මෙම වාර්තාවේ ඡේද යොමුව |
|---|---|---|
| 1.6.2(අ)(ii) | 2021 වර්ෂයේ රජයේ කැළැවලින් ලැබෙන ආදායම් ගිණුමෙහි උපලේඛන 05 අනුව පසුගිය වසරට පෙර වර්ෂ සඳහා හිඟ ආදායම රු.555,018,063 ක් වුවද, 2022 වර්ෂයට අදාළ ආදායම් ගිණුමෙහි සහ ඊට අදාළ හිඟ ආදායම් ප්‍රකාශයෙහි එය රු.488,264,949 ක් ලෙස දක්වා තිබීමෙන් 2022 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවල හිඟ ආදායම රු.66,753,114 ක් අඩුවෙන් දක්වා තිබුණි. | 1.6.1(අ)(i) |
| 1.6.2(අ)(iii) | 2021 වර්ෂයේ රජයේ කැළැවලින් ලැබෙන ආදායම් ගිණුමට අදාළ හිඟ ආදායම් වාර්තාව අනුව 2022 ජනවාරි 01 දිනට රු.1,060,445,374 ක් වූ පෙර වර්ෂයන්ට අදාළ හිඟ ආදායම 2022 දෙසැම්බර් 31 දිනට රු.59,920,642 ක් වීමෙන් 2022 වර්ෂය තුළ පෙර වර්ෂ වෙනුවෙන් රැස්කළ හිඟ ආදායම රු.1,000,524,732 ක් විය. එසේ වුවද, 2022 දෙසැම්බර් 31 දිනට ආදායම් ගිණුමේ එම හිඟ ආදායම රු.901,779,894 ක් වශයෙන් දක්වා තිබීමෙන් රු.98,744,838 ක වෙනසක් නිරූපණය විය. | 1.6.1(අ)(ii) |

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

### 1.6.1 ගිණුම්කරණ අඩුපාඩු

#### (අ) ආදායම් ලැබීම්

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (i) | හිඟ ආදායම් වාර්තාව අනුව සමාලෝචිත වර්ෂය ආරම්භයේ හිඟ ආදායම වන රු.447,426,633 ට සමාලෝචිත වර්ෂය සඳහා වූ හිඟ ආදායම රු.455,286,391 ක් සහ වර්ෂය තුළ අයකර ගැනීම් ලෙස දක්වා ඇති රු.1,106,450,075 ක් ගැලපීමෙන් පසු වර්ෂය අවසානයට හිඟ ආදායම ඉක්මවා රු.203,737,051 ක වැඩිපුර අයකර ගැනීමක් නිරූපණය වන අතර එහි නිරවද්‍යතාව සහ | දෙපාර්තමේන්තුවේ හිඟ ආදායම් විශ්ලේෂණය කර විගණනය වෙත ද ඉදිරිපත් කර ගණනය කිරීම් නිවැරදි කිරීමට කටයුතු කරමි. | පූර්ව වර්ෂවලට ද බලපාන ආකාරයට නිවැරදි කර ගැනීමට කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | සමාලෝචිත වර්ෂය අවසානයට හිඟ ආදායම ලෙස දක්වා ඇති රු. 2,095,359,351 හි නිරවද්‍යතාවය තහවුරු නොවීය. | | |
| **(ii)** | 2002.01.02 රජයේ කැලෑවලින් ලැබෙන ආදායම් ශීර්ෂය 2002.01.02 යටතේ වෙනත් ආයතන විසින් රැස්කර තිබූ ආදායම් රු.862,957,755 ක් වුවද, මූල්‍ය ප්‍රකාශනවල රු.717,332,835 ක් ලෙස දක්වා තිබීමෙන් රු.145,624,920 ක වෙනසක් නිරීක්ෂණය විය. | නිවැරදි අගය රු.862,957,755 ක් වේ. සාවද්‍ය දැක්වීම් නිරවද්‍ය කර ගැනීමට කටයුතු කරමි. | රැස්කළ නිවැරදි ආදායම මූල්‍ය ප්‍රකාශනවලට ඇතුළත් කිරීමට කටයුතු කළ යුතුය. |
| (iii) | සමාලෝචිත වර්ෂයේ රජයේ කැලෑවලින් ලද තත්‍ය ආදායම රු.1,739,394,572 ක් වුවද, සංශෝධිත ආදායම් ඇස්තමේන්තුව හා තත්‍ය ආදායම අතර විචලතා පැහැදිලි කිරීම් ප්‍රකාශයේ (ඒසීඒ-1(III)) රු.179,394,752 ක් ලෙස රු.1,559,999,820 ක් අඩුවෙන් දක්වා තිබුණි. | නිවැරදි අගය රු.1,739,394,572 කි. ඒ අනුව සාවද්‍ය දැක්වීම් සංශෝධනය කර ගැනීමට කටයුතු කරමි. | රැස්කළ නිවැරදි ආදායම මූල්‍ය ප්‍රකාශනවලට ඇතුළත් කිරීමට කටයුතු කළ යුතුය. |

**(ආ) පුනරාවර්තන වියදම්**

| **විගණන නිරීක්ෂණය** | **ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|
| වාහන අළුත්වැඩියා වෙනුවෙන් දරන ලද එකතුව රු.3,454,665 ක් වූ පුනරාවර්තන වියදම් ඊට අදාළ අංක 1301 දරන වැය විෂයයට හර නොකර මුදල් රෙගුලාසි 66 ට පටහැනිව අංක 2003 දරන ප්‍රාග්ධන වැය විෂයයට හර කර තිබුණි. එම පුනරාවර්තන වැය විෂයයෙහි 2023 දෙසැම්බර් 31 දිනට පැවති රු.328,527 ක ඉතිරියට ඉහත වියදම ගැලපීමේ දී වැය විෂයෙහි ඉතිරිය ඉක්ම වූ අධිවැය රු.3,126,138 ක් විය. | අදහස් දක්වා නොමැත. | නිවැරදි වැය විෂයයන් යටතේ වියදම් ගිණුම්ගත කිරීමට කටයුතු කළ යුතුයි. |

**(ඇ) රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම පිළිබඳ සැසඳුම් ප්‍රකාශය**

| **විගණන නිරීක්ෂණය** | **ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|
| අත්තිකාරම් ගිණුම් පිළිබඳ ප්‍රකාශනය (ඒසීඒ 05) අනුව 2023 දෙසැම්බර් 31 දිනට ණය ශේෂය රු.210,989,434 ක් වුවද, දෙපාර්තමේන්තු පාලන ගිණුම අනුව ණය ශේෂය රු.210,857,676 ක් විය. දෙපාර්තමේන්තු පාලන ගිණුමේ ආරම්භක ශේෂයට රු.131,761 ක සාවද්‍ය ගැලපීමක් සිදු කිරීම ඊට හේතු වී තිබුණි. | නිවැරදි කිරීමට කටයුතු කරමි. | පාලන ගිණුම් ශේෂය නිවැරදි කිරීමට කටයුතු කළ යුතුය. |

(ඇ) **දේපළ පිරියත හා උපකරණ**

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (i) | මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය අනුව මූලධන වත්කම් පුනරුත්ථාපනය හා වැඩිදියුණු කිරීම් රු.31,792,853 ක් හා මූලධන වත්කම් අත්පත් කර ගැනීම් රු.841,458,772 ක් වීමෙන් සමාලෝචිත වර්ෂයේ මූලධන වත්කම්වල වැඩිවීම රු.873,251,625 ක් වුවද, මූල්‍ය නොවන වත්කම් වාර්තාවේ (SA 82) එම අගය රු.649,506,350 ක් ලෙස රු.223,745,275 ක් අඩුවෙන් දැක්වුණි. | අදහස් දක්වා නොමැත. | මූලධන වත්කම් නිවැරදිව මූල්‍ය ප්‍රකාශනවලට ඇතුළත් කිරීමට කටයුතු කළ යුතුය. |
| (ii) | භාණ්ඩාගාර මුද්‍රිත **SA** 82 අනුව ඉකුත් වර්ෂය අවසානයට මූල්‍ය නොවන වත්කම් වර්ග 05 ක ශේෂය රු.4,202,503,643 ක් වුවද, සමාලෝචිත වර්ෂයේ ජනවාරි 01 දිනට එම ශේෂය රු.4,045,324,877 ක් ලෙස රු.157,178,766 ක් අඩුවෙන් දක්වා තිබුණි. | අදහස් දක්වා නොමැත. | අදාළ ගැලපීම් නිවැරදි කිරීමට කටයුතු කළ යුතුය. |
| (iii) | දෙපාර්තමේන්තුවේ පුස්තකාල පොත්වල අගය මූල්‍ය ප්‍රකාශනවලට ඇතුළත් කර නොතිබුණි. | මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කිරීමට කටයුතු කිරීමට උපදෙස් ලබා දෙන ලදි . | මූල්‍ය ප්‍රකාශනවලට ඇතුළත් කිරීමට කටයුතු කළ යුතුය. |

(ඉ) **ලේඛන හා පොත්පත් පවත්වා නොතිබීම**

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (i) | **බැරකම් ලේඛනය**<br>මුදල් රෙගුලාසි 214 ප්‍රකාරව බැරකම් ලේඛනයක් පවත්වා නොතිබුණි. | නිසි පරිදි බැරකම් පරික්ෂා කිරීමට හැකිවන පරිදි බැරකම් ලේඛනයක් පවත්වා ගෙන යාමට කටයුතු කර ඇත. | මුදල් රෙගුලාසි ප්‍රකාරව බැරකම් ලේඛනය පවත්වා ගැනීමට කටයුතු කළ යුතුය. |

(ii) **ප්‍රතිග්‍රහණ ලේඛනය**

| | | |
|---|---|---|
| අංක 01 සිට 24,020 දක්වා පුස්තකාල පොත් පිළිබඳ තොරතුරු ඇතුළත් පරිග්‍රහණ ලේඛනය විගණනයට ඉදිරිපත් නොවුණු අතර ඉදිරිපත් වූ පරිග්‍රහණ ලේඛන 2016 දෙසැම්බර් 22 දිනැති ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලයේ අංක 2004/පුස/1 (2006 - සංශෝධිත) දරන චක්‍රලේඛය ප්‍රකාරව යාවත්කාලින කර විධිමත්ව පවත්වා නොතිබුණි. | එකඟ වෙමි. අවශ්‍ය නිවැරදි කිරීම් කිරීමට උපදෙස් ලබාදෙන ලදී. | ලේඛන යාවත්කාලීන කර පවත්වා ගත යුතු අතර අස්ථාන ගත ලේඛනය විගණනයට ඉදිරිපත් කිරීමට කටයුතු කළ යුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 ආදායම් කළමනාකරණය

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | නුවරඑළිය කුඩා පරිමාණ ජල විදුලි බලාගාරයක් පවත්වාගෙන යැම සඳහා පුද්ගලික සමාගමකට ලබා දී තිබුණු භූමි ප්‍රමාණයට වඩා පර්චස් 72 ක් වැඩියෙන් 2016 වර්ෂයේ සිට පරිහරණය කර තිබුණු අතර එම සමාගම විසින් 2019 වසරේ සිට වාර්ෂික බලපත්‍ර ගාස්තු ගෙවීම නවතා තිබුණි. 2023 අගෝස්තු 24 දින වන විටත් ඉඩමේ අයිතිය තහවුරු කිරීමට දෙපාර්තමේන්තුව අපොහොසත් වීම හේතුවෙන් 2016 වර්ෂයේ සිට 2019 වර්ෂය දක්වා පර්චස් 72 ක් සඳහාත්, 2019 වර්ෂයේ සිට 2023 වර්ෂය දක්වා පර්චස් 174 සඳහාත් අයවිය යුතු රු.5,435,860 ක් (වැට් බදු සමඟ) අය කර ගැනීමට නොහැකි වී තිබුණි. | අදාළ ගාස්තු නොගෙවන්නේ නම් බලපත්‍රය අවලංගු කර ඔවුන්ට එරෙහිව ආඥා පනත අනුව නීතිමය කටයුතු කිරීමට අවශ්‍ය පියවර ගෙන ඇත. | ව්‍යාපෘතියේ ක්‍රියාකාරීත්වය පරීක්ෂා කිරීමටත්, අදාළ ගාස්තු අයකර ගැනීමටත් කටයුතු කළ යුතුය. |
| (ආ) | බදුල්ල, අම්පාර හා මොණරාගල දිසාවන් හි ගල් කොරි හිමියන් විසින් ගෙවීම පැහැර හැර තිබුණු පිළිවෙලින් රු.5,188,707 ක්, රු.34,147,382 ක් හා රු.7,604,227 ක් ලෙස එකතුව රු.46,940,316 ක් වන හිඟ මුදල් අයකර ගැනීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | මෙම කළුගල් කැණීම් බලපත්‍රලාභීන්ගේ බලපත්‍ර මේ වන විට ක්‍රියාත්මක තත්ත්වයේ නොපවතී. අදාළ හිඟ මුදල් ගෙවීම සඳහා දැනුම් දී ඇතත් හිඟ මුදල් ගෙවා නැත. | හිඟ මුදල් අයකර ගැනීමට අවශ්‍ය නිසි ක්‍රියාමාර්ග කඩිනමින් ගත යුතුය. |

## 2.2 ගණන්දීමේ නිලධාරී විසින් සිදු කළ යුතු සහතිකවීම්

| | නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | දෙපාර්තමේන්තුවේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ප්‍රධාන ගණන්දීමේ නිලධාරී හා ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිතාවය පිළිබඳව කලින් කල සමාලෝචනය සිදු කර ඒ අනුව පද්ධති ඵලදායි ලෙස කර ගෙන යැමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතු බවත්, එම සමාලෝචනයන් ලිඛිතව සිදු කර එහි පිටපතක් විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතුව තිබුණත්, එවැනි සමාලෝචනයන් සිදු කළ බවට ප්‍රකාශ විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. | කාලීනව දෙපාර්තමේන්තුවේ කටයුතු මෙහෙයුම් ක්‍රියාවලිය අධීක්ෂණය කරමින් හඳුනාගත් අඩුපාඩු නිවැරදි කිරීමට උපදෙස් ලබා දීම අඛණ්ඩව සිදු කෙරේ. | විගණන පනතේ විධිවිධාන ප්‍රකාරව මූල්‍ය පාලනය සම්බන්ධයෙන් සඵලදායී අභ්‍යන්තර පාලනයක් පවත්වා ගෙන යන බවට සහතික විය යුතුය. |
| (ආ) | වාර්ෂික සහ වෙනත් මූල්‍ය ප්‍රකාශ අවශ්‍ය වේලාවන් ඇතුළත පිළියෙල කිරීම සිදු වන බවට ප්‍රධාන ගණන්දීමේ නිලධාරී හා ගණන්දීමේ නිලධාරී විසින් සහතික විය යුතු අතර, ඊට අමතරව විගණනය කරනු ලබන ආස්ථිතියට අදාළ වාර්ෂික වාර්තා පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීමට ප්‍රධාන ගණන්දීමේ නිලධාරී වගබලාගත යුතු වුවත්, වාර්තාවේ 3.4 ඡේදයේ සඳහන් විගණන නිරීක්ෂණය හේතුවෙන් එම අවශ්‍යතා ඉටු කර නොතිබුණි. | ඉදිරියේදී වාර්ෂික කාර්ය සාධන වාර්තාව නියමිත දිනට ඉදිරිපත් කිරීමට කටයුතු කරන බව දන්වමි. | විගණන පනතේ විධිවිධාන ප්‍රකාරව වාර්ෂික කාර්යසාධන වාර්තා නියමිත දිනට පාර්ලිමේන්තුවේ සභාගත කළ යුතුය. |

## 2.3 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම

| නිරීක්ෂණය: නීති, රීති හා රෙගුලාසි වලට යොමුව | නිරීක්ෂණය: වටිනාකම රු. | නිරීක්ෂණය: අනුකූල නොවීම | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| 2020 අගෝස්තු 28 දිනැති අංක 01/2020 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛ මඟින් ප්‍රකාශිත මුදල් රෙගුලාසි 756(6) | - | සමාලෝචිත වර්ෂයට අදාල භාණ්ඩ සමීක්ෂණ වාර්තා විගණකාධිපති වෙත යොමු කිරීම 2024 ජුනි 15 දිනට ප්‍රථම සිදු කළ යුතු වුවද, අගෝස්තු 31 දින වනවිටත් වාර්තා ඉදිරිපත් කර නොතිබුණි. | 2023 වර්ෂයේ භාණ්ඩ සමීක්ෂණ කටයුතු නියමිත දිනට අවසන් කිරීමට සියළු පියවර ගෙන ඇත. | චක්‍රලේඛය ප්‍රකාරව නියමිත දින වකවානු තුළ භාණ්ඩ සමීක්ෂණ කටයුතු අවසන් කර වාර්තා ඉදිරිපත් කළ යුතුය. |

## 2.4 අවිධිමත් ගනුදෙනු

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| වලස්මුල්ල අඩවි වන කාර්යාලයට අයත් පැල තවාන්වල 2021 සිට දෛනික ගෙවීමේ පදනම මත චෙක්රෝල් කම්කරුවන් 1059 ක් ලියාපදංචි කර සේවයේ යොදවාගෙන තිබුණු අතර, එයින් 2021 ජනවාරි සිට 2023 ඔක්තෝබර් දක්වා කාලය සඳහා රු.1,825,165 ක වැටුප් ගෙවන ලද කම්කරුවන් 200 දෙනෙකුගේ නම් හා ජාතික හැඳුනුම්පත් අංක මැතිවරණ කාර්යාල ඡන්දහිමි නාමලේඛනය සමඟ පරීක්ෂාවේ දී නිවැරදි නොවූයෙන් සත්‍ය වශයෙන් එම කම්කරුවන් තවාන්වල වැඩට යොදවාගත් බවට සනාථ කළ නොහැකි විය. | පිළිතුරු ලබා දී නොමැත. | චෙක්රෝල් සේවකයන් පත්කිරීම, සේවයේ යෙදවීම හා වැටුප් ගෙවීම සඳහා විධිමත් අභ්‍යන්තර පාලනයක් ස්ථාපිත කිරීමටත්, යොදවා තිබූ එම කම්කරුවන් සත්‍ය වශයෙන් වැඩට යොදවා ගත් බවට විගණනය වෙත සනාථ කිරීමටත් කටයුතු කළ යුතුය. |

## 2.5 තැන්පත් ශේෂයන්

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | මොණරාගල හා නුවරඑළිය දිසා වන කාර්යාලවල තැන්පත් ගිණුම් 03 ක පැවති 2023 දෙසැම්බර් 31 දින වන විට වසර දෙක ඉක්මවූ එකතුව රු.17,378,163 ක තැන්පත් ශේෂයන් මුදල් රෙගුලාසි 571 ප්‍රකාරව රාජ්‍ය ආදායමට බැර කිරීමට කටයුතු කර නොතිබුණි. | රාජ්‍ය ආදායමට බැරකළ හැකි සියළු ඇප තැන්පතු රාජ්‍ය ආදායමට බැර කිරීමට සටහන් කරගෙන ඒ සම්බන්ධව කටයුතු කරමින් පවතී. | පවත්නා නීතිරීති රෙගුලාසි ප්‍රකාරව තැන්පත් ශේෂ නිරවුල් කිරීමට කටයුතු කළ යුතුය. |
| (ආ) | කලාප නියෝජ්‍ය වන සංරක්ෂක විසින් මොනරාගල දිසා වන කාර්යාලය වෙත 2019 සිට 2022 දක්වා නිශ්චිත කාර්යයන් සඳහා ලබා දී තිබුණු රු.27,508,259 ක ප්‍රතිපාදනවලින් රු.16,802,150 ක් අදාල කාර්යයන් සඳහා වියදම් නොකර විවිධ තැන්පතු ගිණුමේ රඳවා ගෙන තිබුණි. | අදහස් දක්වා නොමැත. | අදාළ කාර්යයන් කාර්යක්ෂමව නිම කර ඉතිරි මුදල් රජයේ ආදායමට ගැනීමට කටයුතු කළ යුතු අතර වර්ෂය අවසානයේ කළාප කාර්යාලවල ඉතිරි මුදල් ප්‍රධාන කාර්යාලයට ගෙන්වාගෙන භාණ්ඩාගාරයට නිවැරදිව අග්‍රිම පියවීමට කටයුතු කළ යුතුය. |

## 2.6 බැංකු ගිණුම් මෙහෙයවීම

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| බැංකු ගිණුම් 13 කට අදාළව 2023 දෙසැම්බර් 31 දිනට බැංකු ප්‍රකාශනවල ඇතුළත්ව තිබූ හඳුනා නොගත් ලැබීම් රු.3,779,168 ක් හඳුනාගෙන කාලීනව මුදල් පොතට ගැනීමට කටයුතු කර නොතිබුණි. | පිළිගනිමි. නිවැරදි කිරීමට කටයුතු කරමි. | ලැබීම් නිවැරදිව හඳුනාගෙන මුදල් පොතට ගැලපීම් කර භාණ්ඩාගාරයට වාර්තා කිරීමට කටයුතු කළ යුතුය. |

## 3. මෙහෙයුම් සමාලෝචනය

## 3.1 සැලැසුම් කිරීම

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2020 අගෝස්තු 28 දිනැති අංක 02/2020 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය මඟින් හඳුන්වා දී ඇති නව ආකෘතියට පටහැනිව සකස් කරන ලද සමාලෝචිත වර්ෂයේ ක්‍රියාකාරී සැලැස්ම සඳහා 2023 පෙබරවාරි 08 දින අමාත්‍යාංශ ලේකම්වරයාගේ අනුමැතිය ලබා ගෙන තිබුණු අතර එම ක්‍රියාකාරී සැලැස්ම 2023 සැප්තැම්බර් 19 දින ද, මූල්‍ය වර්ෂය අවසන් වී 2024 ජූනි 03 දින ද සංශෝධනය කර තිබුණි. ඒ අනුව දෙපාර්තමේන්තුවේ ක්‍රියාකාරී සැලැස්ම මනා කළමනාකරණ මෙවලමක් ලෙස භාවිතයට ගෙන නොතිබුණි. | පිළිතුරු දී ලබා නොමැත. | නියමිත ආකෘතියට අනුව ක්‍රියාකාරී සැලැස්ම සකස් කර කළමනාකරණ මෙවලමක් ලෙස භාවිතයට ගත යුතුය. |

## 3.2 කාර්යභාරයන් ඉටු නොකිරීම

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | වන සංරක්ෂණ දෙපාර්තමේන්තු පාලනය යටතේ පවතින විශාල වනාන්තර ප්‍රමාණයක් රක්ෂිත වනාන්තර ලෙස ගැසට් කර ප්‍රසිද්ධියට පත් කිරීමට ප්‍රමාද කිරීම හේතුවෙන් රක්ෂිත වනාන්තර ආශ්‍රිතව අනවසර ඉඩම් අල්ලා ගැනීම් බහුලව සිදුවී ඇති අතර ඒවා රක්ෂිත භාවයෙන් නිදහස් කිරීමට සිදු වී තිබීමෙන් පවතින ස්වභාවික වනගහන ප්‍රතිශතය ක්‍රමයෙන් පහළ බැසීම තුළින් තිරසර | පිළිතුරු ලබා දී නොමැත. | රක්ෂිත මැණීම හා ගැසට් මඟින් අයිතිය තහවුරු කර ගැනීමේ ක්‍රියාවලිය කඩිනම් කර වන විනාශය මඟහරවා ගත යුතුය. |

| | | | |
|---|---|---|---|
| | සංවර්ධන අරමුණු කෙරෙහි අහිතකර බලපෑම් ඇති විය හැකි බව නිරීක්ෂණය විය. රක්ෂිත වනාන්තර ලෙස මොණරාගල දිසාව තුළ 2021 වර්ෂයෙන් පසු ගැසට් කර නොතිබුණු හෙක්ටයාර් 25,892 ක වනාන්තර 147 ක් ද, අම්පාර දිසාව තුළ 2019 වර්ෂයෙන් පසු ගැසට් කර නොතිබු හෙක්ටයාර 22,657.78 ක් වූ වනාන්තර 64 ක් ද පැවතුණි. මෙම තත්ත්වය හේතුවෙන් දීර්ඝ කාලයක සිට අනවසර වගා කිරීම් සහිත කැබලිත්ත රක්ෂිතයේ අක්කර 25,000 කට ආසන්න ප්‍රමාණයක් දෙපාර්තමේන්තු පරිපාලනයෙන් බැහැර කිරීමට සිදු වී තිබුණි. | | |
| (ආ) | ග්‍රාමීය ප්‍රජාවන්ගේ ජීවන මට්ටම ඉහළ නැංවීම අරමුණු කොට, සංරක්ෂණ ක්‍රියාවලියට අවහිර නොවන අයුරින් පරිසර සංචාරක කටයුතු පවත්වාගෙන යාම දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යයක් වන බැවින් මන්දාරම්නුවර සංචාරක කලාපය වැඩිදියුණු කිරීම හා කඳවුරු භූමි සඳහා ස්ථිර ආවරණ සකස් කිරීමට රු.9,100,000 ක පිරිවැය ඇස්තමේන්තුවක් හා ව්‍යාපෘති යෝජනාවක් ඉදිරිපත් කර තිබුණ ද එය ක්‍රියාත්මක කිරීම සඳහා දෙපාර්තමේන්තුව කටයුතු කර නොතිබුණි. | පිළිතුරු ලබා දී නොමැත. | දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යයක් වන පාරිසරික සංචාරක කර්මාන්තය වැඩි දියුණු කිරීම සඳහා සකස් කළ සැලසුම් ක්‍රියාත්මක කිරිමටත්, තව තවත් සංචාරක කළාප ප්‍රවර්ධනය කිරීමටත් කටයුතු කළ යුතුය. |

## 3.3 වාර්ෂික කාර්යසාධන වාර්තාව

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2020 අගෝස්තු 28 දිනැති අංක 2/2020 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 12.1 ඡේදය ප්‍රකාරව වාර්ෂික කාර්යසාධන වාර්තාව භාෂාත්‍රයෙන් සකස් කර මුදල් වර්ෂය අවසන් වී දින 150 ක් ගත වීමට පෙර සභාගත කිරීමට පාර්ලිමේන්තුවට ඉදිරිපත් කළ යුතු වුවත්, 2022 වර්ෂයේ වාර්ෂික කාර්ය සාධන වාර්තාව මාස 07 ක ප්‍රමාදයකින් පසු 2024 ජනවාරි 03 දින පාර්ලිමේන්තුවට ඉදිරිපත් කර තිබුණි. | 2023 අගෝස්තු 16 දිනැතිව 2022 කාර්යය සාධන වාර්තාව මුද්‍රණය කිරීම සඳහා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවෙන් මිල ගණන් කැඳවීමට කටයුතු කර ඇති බැවින් ප්‍රමාද වු බව දන්වමි. ඉදිරියේදී ප්‍රමාදයන් සිදු නොවීමට වගබලා ගන්නා බව දන්වමි. | චක්‍රලේඛ ප්‍රකාරව වාර්ෂික කාර්යසාධන වාර්තාව නියමිත දින වකවානු ඇතුළත පාර්ලිමේන්තුවට ඉදිරිපත් කළ යුතුය. |

## 3.4 වත්කම් කළමනාකරණය

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | දෙපාර්තමේන්තුවේ භෞතිකව පවතින වාහන සංචිතය 2022 වර්ෂයේ 423 ක් හා 2023 වර්ෂයේ 676 ක් බවට තහවුරු කර තිබුණු අතර ප්‍රාදේශීය කාර්යාල විසින් ප්‍රධාන කාර්යාලය සහ කොම්ප්ට්‍රෝල ජනරාල් වෙත වාර්තා කර ඇති තොරතුරු අතර ද පරස්පරතාවයන් පැවතුණි. එසේම වසරක පමණ කාලයක සිට අපහරණය සඳහා නිර්දේශිත වාහන 167 ක් හා අයිතිය දෙපාර්තමේන්තුව වෙත පවරා නොගත් අපහරණය සඳහා නිර්දේශිත වාහන 20 ක් පැවතීමත්, වෙනත් ආයතන සතු එහෙත් අයිතිය දෙපාර්තමේන්තුව වෙත පවරා නොගත් වාහන සංඛ්‍යාව කොපමණද යන්න හඳුනාගෙන නොතිබීමත්, දෙපාර්තමේන්තු වාහනවල රාජ්‍ය ලාංඡනය යෙදීමට කටයුතු කර නොතිබීම යනාදී කරුණු අනුව වාහන සම්බන්ධ අභ්‍යන්තර පාලනය සතුටුදායක නොවුණි. | දෙපාර්තමේන්තුව සතු සියලු වාහන තොරතුරු ප්‍රාදේශීය කාර්යාල වෙතින් ගෙන්වාගෙන සකස් කළ ලේඛනය අනුව මුළු වාහන සංඛ්‍යාව 676 ක් විය. නමුත් මේ වනවිට කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලය විසින් හඳුන්වා දුන් මාර්ගගත මූල්‍ය නොවන වත්කම් කළමනාකරණ පද්ධතියට අනුව කලාප කාර්යාල මඟින් ඇතුළත් කර ඇති වාහන තොරතුරු හා ප්‍රධාන කාර්යාලය වෙත ගෙන්වා ගත් වාහන තොරතුරු අතර යම් යම් වෙනස්කම් පවතින බැවින් ඒවා නිවැරදි කර මුළු වාහන සංඛ්‍යාව කඩිනමින් ලබා දීමට කටයුතු කරමි. | වාහන භෞතික සංගණනයක් සිදුකර දෙපාර්තමේන්තුවේ පවතින තොරතුරු සමඟ සැසඳීම් කර දෙපාර්තමේන්තුව සතු වාහන නිවැරදිව හඳුනා ගෙන කොම්ප්ට්‍රෝල් ජනරාල් වෙත වාර්තා කිරීමට කටයුතු කළ යුතුය. |
| (ආ) | නුවරඑළිය, ත්‍රිකුණාමලය, අම්පාර සහ බදුල්ල යන දිස්ත්‍රික්කයන්ට අදාළව වාහන 09ක් 2022 ට පෙර සිට අළුත්වැඩියා නොකර ගාල් කර තිබුණු අතර 2014 වර්ෂයේ දී ත්‍රිකුණාමල දිස්ත්‍රික් ලේකම් කාර්යාලය වෙතින් ලැබී ගෝමරන්කඩවල අඩවි වන කාර්යාලයට අනුයුක්ත කර තිබුණු අයිතිය පවරා නොගත් TATA සිංගල් වර්ගයේ කැබ් රථයක් භාවිතයෙන් තොරව දිරාපත්වීමට ඉඩහැර තිබුණි. | TATA සිංගල් වර්ගයේ කැබ් රථය අළුත්වැඩියා කිරීම සඳහා ප්‍රතිපාදන අවශ්‍ය බව ඉල්ලීමක් හෝ එය භාවිතයෙන් තොරව ඇති බවට ප්‍රධාන කාර්යාලයේ ප්‍රවාහන අංශය වෙත දැනුම්දීමක් කර නොමැත. එසේම එහි අයිතිය පවරා ගැනීමට කටයුතු කිරීමට නියමිත ය. | වාහන සම්බන්ධ නිසි පාලන පද්ධතියක් ස්ථාපිත කර වාහන නඩත්තුව හා පරිහරණය කාර්යක්ෂම කිරීමට කටයුතු කළ යුතුය. |
| (ඇ) | 2022 ජනවාරි 27 දින සන්නද්ධ කල්ලියකගේ ප්‍රහාරයකට ලක් වීමෙන් දැඩි ලෙස හානියට පත් වී තිබුණු කන්තලේ අඩවි වන කාර්යාලයේ රාජකාරී කටයුතු සඳහා අනුයුක්ත කර තිබුණු කැබ් රථයක් අනතුරට ලක්වී වසර 02 කටත් අධික කාලයක් ගතවී ඇතත් පවතින නඩු | කැබ් රථයේ අනතුර සම්බන්ධයෙන් මුතූර් මහේස්ත්‍රාත් අධිකරණයේ නඩුවක් විභාග වෙමින් පවතී. නඩුවේ පැමිණිල්ල මෙහෙයවන සේරුවිල පොලීසිය වෙතින් විමසීමක් සිදු කර ඉදිරි කටයුතු සඳහා වාර්ථා කරන බවට ත්‍රිකුණාමලය දිසා වන නිලධාරි | නඩු කටයුතු අවසන් කර ගැනීම සඳහා අවශ්‍ය කටයුතු සිදු කර වාහනය අලුත්වැඩියා කර භාවිතයට ගැනීමට කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | කටයුතු අවසන් කර ගැනීම සඳහා කටයුතු නොකර නිෂ්කාර්යව ගාල් කර තැබීමෙන් තවදුරටත් අමතර අළුත්වැඩියාවන් ඇතිවිය හැකි බවට නිරීක්ෂණය විය. | විසින් ලිඛිතව දන්වා ඇති අතර ඉදිරි කටයුතු කඩිනමින් සිදු කිරීම සඳහා මූලික විමර්ශන වාර්ථාව, මු.රේ. 104 (3) වාර්ථාව, මෝටර් රථ පරීක්ෂකවරයෙකුගේ ඇස්තමේන්තුව සහ ප්‍රසම්පාදන කමිටු නිර්දේශය හා අනුමැතිය ඉදිරිපත් කරන ලෙස දන්වා ඇත. | |
| (ඇ) | දෙපාර්තමේන්තුවේ ගොඩනැඟිලි අළුත්වැඩියා සහ නඩත්තු කටයුතු නිසි අයුරින් සිදු කිරීම සම්බන්ධ වැඩ පිළිවෙලක් නොතිබීමෙන් නුවරඑළිය, ත්‍රිකුණාමල, අම්පාර, බදුල්ල සහ මොනරාගල යන දිස්ත්‍රික්ක තුළ පවතින ගොඩනැඟිලි 05ක්, නිල නිවාස 20ක් සහ කාර්යාල ගොඩනැඟිලි එකක් අබලන් හා අනතුරුදායක තත්ත්වයක පැවතිණි. | වර්ෂය තුළ පවත්නා ප්‍රතිපාදන සීමිත බැවින් ප්‍රමුඛතාවය පරිදි අළුත්වැඩියා හා නඩත්තු කටයුතු සිදු කරගෙන යන බව දන්වමි. | ගොඩනැඟිලි අලුත්වැඩියා හා නඩත්තුව සම්බන්ධයෙන් නිසි වැඩ පිළිවෙලක් අනුව සිදු කළ යුතුය. |
| (ඉ) | වන අපරාධ සම්බන්ධ නඩු කටයුතු අවසන් කිරීම සහ අවසන් වී ඇති නඩු සම්බන්ධව පසු විපරම් කිරීමේ කටයුතු ඉතා මන්දගාමීව පවතින බැවින් නඩු භාණ්ඩ වශයෙන් පවතින 2017 වර්ෂයේ සිට 2023 වර්ෂය දක්වා කාලය තුළ අත්අඩංගුවට ගත් ට්‍රැක්ටර් හා අත් ට්‍රැක්ටර් 45 ක් ද, ඵලදායි ලෙස අපහරණය කිරීමට පියවර නොගත් ජංගම ඉරුම්හල් රැසක් සහ වන අපරාධ දැව රැසක් ද දිරාපත්ව මහියංගන අඩවි වන කාර්යාල භූමිය තුළ විනාශ වෙමින් පැවතුණි. | මහියංගනය අඩවි වන කාර්යාල භූමියේ ගාල් කර ඇති ට්‍රැක්ටර් හා අත් ට්‍රැක්ටර් වන අපරාධ හේතුවෙන් අත්අඩංගුවට ගත් ඒවා බැවින් ප්‍රවාහන අංශයට අදාළ නොවේ. | නඩු කටයුතු ඉක්මනින් අවසන් කර ගැනීමට අවශ්‍ය කටයුතු සිදුකර එම වත්කම් ඵලදායි ආකාරයට යෙදවීමට කටයුතු කළ යුතුය. |

## 3.5 පාඩු හා හානි

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| මොණරාගල දිසාවන කාර්යාලයේ 2021 හා 2022 වර්ෂයන්හි වාහන 03 කට සිදුවී තිබුණු අනතුරු ප්‍රධාන කාර්යාලයේ හානි හා පාඩු ලේඛනයේ ඇතුළත් කර නොතිබුණි. ඉන් 2022 නොවැම්බර් 25 දින අනතුරට ලක් වී අළුත්වැඩියාව සඳහා රු.324,000 ක් ඇස්තමේන්තු කර තිබුණු ජීප්රථයේ මුදල් රෙගුලාසි 104(3) ප්‍රකාර ප්‍රාරම්භක වාර්තාව ද විගණනයට ඉදිරිපත් නොවුණි. | පිළිතුරු ලබා දී නොමැත. | අලාභ හානි නිවැරදිව තක්සේරු කර ලේඛනවලට ඇතුළත් කළ යුතුය. |

## 3.6 අනාර්ථික ගනුදෙනු

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ක්‍රියාකාරි සැළැස්මට ඇතුළත් කර තිබුණු රෝපනය කරන ලද පැළ බෙදා හැරීමේ කාර්යය සඳහා සැළසුම්ගත වැඩපිළිවෙලක් නොතිබීම හේතුවෙන් විවිධ වැඩසටහන් යටතේ පසුගිය වසර කිහිපයක් තුළ ප්‍රධාන පැල තවාන්වල නිෂ්පාදනය කරන ලද විවිධ වර්ගයේ පැළ 861,921 ක් පමණ ද, දියතලාව හමුදා කඳවුර හා සම්බන්ධ හෙක්ටයාර 42 ක නරියා කන්ද පයිනස් වන වගා භූමිය තුළ නැවත සිටුවීම සඳහා 2021 වර්ෂයේ රෝපණය කර තිබුණු පැළ 160,000 කින් බොහෝමයක් ද වලස්මුල්ල අඩවි වන කාර්යාලයට අයත් පැළ තවාන් 04 ක සිටුවන ලද පැල 325,500 කින් සියයට 65 ක් වන පැල 210,759 ක් ද හානියට ලක්වීම නිසා ඒ සඳහා වැයකර තිබුණු රු.10,145,508 ක් ද නිෂ්කාර්යය වියදම් බවට පත්ව තිබුණි. | පිළිතුරු දී නොමැත. | අවශ්‍යතාවය අනුව පැළ රෝපනය කිරීමටත්, නිෂ්පාදිත පැළ කාර්යක්ෂමව සිටුවීමටත් සැලසුම් සහගත වැඩපිළිවෙලක් අනුව කටයුතු කළ යුතුය. |

## 3.7 කළමනාකරණ දුර්වලතා

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | අම්පාර, ත්‍රිකුණාමලය, මොණරාගල දිස්ත්‍රික්කවල සිදු කළ ක්ෂේත්‍ර පරීක්ෂාවලදී, නීතිරීති නොතකා කැණීම් සිදු කිරීමෙන් ගං ඉවුර සෝදාපාලුවට ලක්වී තිබීම, අනාරක්ෂිත ලෙස ඉවතලන ප්ලාස්ටික්, පොලිතීන් ආදිය පරිසරයට මුදාහැර තිබීම, එක් ප්‍රවේශ මාර්ගයක් වෙනුවට රක්ෂිතයට හානි සිදු කර මාර්ග කිහිපයක් සකස් කරගෙන තිබීම, "සී" බලපත්‍ර ලබා නොගෙන කැණීම් සඳහා වනයට ඇතුළු වීම, වාහන බලපත්‍රය රහිතව වැලි පැටවීම සඳහා වැලි මංකඩට ලොරි රථ ඇතුළු වීම, කොන්ත්‍රාත්කරුවන් විසින් බලපත්‍ර ලබා නොගෙන ගල් කඩා ඉවත් කර ගැනීම, භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශය විසින් පරිසර සංරක්ෂණයන් කෙරෙහි අවධානය යොමු නොකිරීම, ගිවිසුම් කොන්දේසි උල්ලංඝන කර කළුගල් කැඩීමෙන් පසු නිර්මාණය වූ විශාල වලවල්වල ජලය පිරී අනාරක්ෂිත පරිසරයක් නිර්මාණය වී තිබීම හා එම වලවල් වැසීම සඳහා කසළ බැහැර කර තිබීම යනාදී කරුණු නිරීක්ෂණය වීමෙන් දෙපාර්තමේන්තුව තුළ කැණීම් බලපත්‍ර නිකුත් කිරීම, පාලනය, අධීක්ෂණය සහ පසු විපරම් කිරීම සම්බන්ධයෙන් කාර්යක්ෂම හා සතුටුදායක අභ්‍යන්තර පාලන ක්‍රමයක් නොමැති වීමත් සහ වනජ ද්‍රව්‍ය ඉවත් කිරීමේ දී විවිධ අක්‍රමිකතා, වන අපරාධ සහ | පිළිතුරු ලබා දී නොමැත. | වනජ ද්‍රව්‍ය ඉවත් කිරීමේ ක්‍රියාවලිය පිළිබඳ විධිමත් නියාමනයක් සිදු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | පාරිසරික හානි විශාල ලෙස සිදු වී දෙපාර්තමේන්තුවට ආදායම් ද අහිමි වී තිබුණි. | | |
| (ආ) | නුවරඑළිය දිසාවන කාර්යාල බල ප්‍රදේශය තුළ ඉදිකර ඇති දුරකථන සම්ප්‍රේක්ෂණ කුළුණු 06 කට අදාළ බලපත්‍ර අලුත් නොකිරීමෙන් වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවට අහිමි වී ඇති අදායම රු.22,778,372 ක් විය. | පිළිතුරු ලබා දී නොමැත. | විධිමත් පසු විපරම් ක්‍රියාවලියක් ස්ථාපිත කර කාලානුරූපව ආදායම් රැස් කර හිඟ ආදායම් ඇතිවීම වළක්වා ගත යුතුය. |
| (ඇ) | රූපවාහිනී සේවා ආයතනයක් විසින් රූපවාහිනී සම්ප්‍රේෂණ කුළුණක් ඉදිකිරීම සඳහා 2006 වර්ෂයේදී විවිධ අවසර බලපත්‍රයක් මඟින් නුවරඑළිය කිකිලියාමාන යෝජිත රක්ෂිතයෙන් පර්චස් 35 ක බිම් කැබැල්ලක් වෙන් කරවා ගෙන තිබුණු නමුත් එම සම්ප්‍රේක්ෂණ කුළුණ ඉදිනොකර 2011 වර්ෂය තෙක් පර්චස් 01 ක් සඳහා රු.2,500 ක් බැගින් පර්චස් 35 ක් සඳහා බදු මුදල් ගෙවමින් වසර 06 කට ආසන්න කාලයක් බලපත්‍රයේ කාලය පමණක් දීර්ඝ කරගෙන තිබුණු අතර එම අවසර පත්‍රය අවලංගු කර නොගෙන 2012 වර්ෂයේ සිට බදු ගෙවීම පැහැර හැරීම හේතුවෙන් වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවට අහිමි වී ඇති වෙනත් අයකිරීම් රහිත ආදායම රු.1,050,000 ක් විය. | පිළිතුරු ලබා දී නොමැත. | විධිමත් පසු විපරම් ක්‍රියාවලියක් ස්ථාපිත කර කාලානුරූපව ආදායම් රැස් කර හිඟ ආදායම් ඇතිවීම වළක්වා ගත යුතුය. |
| (ඈ) | වන සංරක්ෂණ දෙපාර්තමේන්තු පාලනය යටතේ පවතින වනාන්තර තුළ වැලි කැණීම් සඳහා ගාස්තු අයකළ ද, ප්‍රාදේශීය ලේකම්ගේ නිර්දේශ මත වැලි කැණීම් සිදු කරන කොන්ත්‍රාත්කරුවන්ගෙන් ගාස්තු අය නොකරන බැවින් රජයට විශාල ආදායමක් අහිමි වී තිබුණි. සම්බන්ධිත ආයතන අතර අන්තර් සම්බන්ධතාවක් පවත්වා ගනිමින් රජය සතු සම්පත් බදු දීමේ දී ඒකාකාරී ප්‍රතිපත්තියක් අනුගමනය නොකිරීම ඊට හේතුවී තිබුණි. | පිළිතුරු ලබා දී නොමැත. | අදාළ ආයතන අතර මනා සම්බන්ධීකරණයක් පවත්වා ගනිමින් රජයට සිදු වියහැකි අලාභ අවමකර ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ඉ) | 2020 දෙසැම්බර් 22 දිනැති අංක: 20/1852/317/012 දරණ අමාත්‍ය මණ්ඩල තීරණය ප්‍රකාරව භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යංශය විසින් සෑම මාස 06 කට වතාවක් එක් එක් කැණීම් ස්ථාන ආශ්‍රිතව සිදු කරන ලද කැණීම් ප්‍රමාණය, සමෝච්ඡ රේඛා සිතියම් අනුව ගණනය කර අදාළ රජයේ ඉඩම් කළමනාකාරිත්වය හිමි ආයතනය, පුපුරණ ද්‍රව්‍ය පාලන අධිකාරිය හා කැණීම්කරු වෙත දැනුම් දිය යුතු වුවද, එම වාර්තා නියමිත කාලවකවානු තුළ ලබා ගැනීමට කටයුතු නොකිරීමෙන් ගල්කොරි හිමිකරුවන් විසින් සීමාව ඉක්මවා සිදු කරන කැණීම් වෙනුවෙන් හිඟ ගාස්තු කාලීනව හා නිසියාකාරව අය කර ගැනීමට හැකිවී නොතිබුණි. | පිළිතුරු ලබා දී නොමැත. | පවතින නීති රීති අනුව කටයුතු කිරීම සඳහා සුදුසු ක්‍රමවේද අනුගමනය කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඊ) | පූර්ණ හෙළීම් සඳහා මොනරාගල දිසා වන කාර්යාලය විසින් 2021 වර්ෂය තුළ රාජ්‍ය දැව සංස්ථාව වෙත භාරදෙන ලද වන වගා 05 ක් නියමිත කාලය තුළ හෙළීම් කිරීමට කටයුතු කර නොතිබීම නිසා දෙපාර්තමේන්තු ක්‍රියාකාරී සැලැස්මට අනුව නැවත වන වගා කටයුතු කිරීමට නොහැකි වී තිබුණි. එම නිසා තවාන්වල රෝපණය කරන ලද පැළ හානියට පත්වීමෙන් හා නඩත්තු කටයුතු සඳහා ඉහළ පිරිවැයක් දැරීමට සිදු වීමෙන් වන පාඩුව වළක්වා ගැනීමට අවශ්‍ය පියවර ගෙන නොතිබුණි. | පිළිතුරු ලබා දී නොමැත. | ආයතන දෙක අතර මනා සම්බන්ධීකරණයක් පවත්වා ගනිමින් හෙළීම් කටයුතු කාර්යක්ෂමව ඉටු කර ගැනීමට කටයුතු කළ යුතුය. |
| (උ) | මුහුදු මට්ටමේ සිට අඩි 5,000 කට වැඩි උසකින් යුත් ජලධාරිතා ප්‍රදේශයක් වන හල්ග්‍රන්ඔය අඩවියේ කුරුදුඔය රක්ෂිතයෙන් 1971 වර්ෂයේ දී පුද්ගලයන් 72 දෙනෙකුට ඇපල් වගා කිරීම සඳහා අක්කර 240 ක් ලබා දී තිබුණු නමුත් ඇපල් වගාව ස්ථාපිත නොකිරීම හා 1977 වසරේ සිට නියමිත බදු මුදල් නොගෙවීම හේතුවෙන් එම බලපත්‍ර 1978 වර්ෂයේ දී අවලංගු කර තිබුණි. එහෙත් බලපත්‍රලාභීන් එම ඉඩම් අතනොහැර ගොවිතැන් කටයුතු කරමින් 1990 වර්ෂය වන විට ඉඩම් අක්කර 1,000 ක පමණ ප්‍රමාණයක් අනවසරයෙන් අල්ලාගෙන තිබුණි වර්තමානය වන විට බොහෝ පිරිසක් ස්ථිර ජනාවාස හා තාවකාලික ජනාවාස ඉදිකරගෙන පදිංචි වී සිටින බව ද නිරීක්ෂණය විය. | මෙම ප්‍රදේශය ජලපෝෂක ප්‍රදේශයක් වන අතර මෙම ඉඩම් ගොවීන් වෙත පවරා දෙන අවස්ථාවේ පැවති වනාන්තර තත්ත්වය පිළිබඳ වාර්තා නොමැති අතර වර්ථමානයේ පවතින ස්වාභාවික වනාන්තර හෝ වන වගා වලට හානි සිදු වී නොමැති බව දන්වමි. | රක්ෂිත වනාන්තර ආරක්ෂා කිරීම සඳහා ශක්තිමත් වැඩ පිළිවෙලක් නිර්මාණය කර ක්‍රියාත්මක කළ යුතුය. |

## 4. තිරසර සංවර්ධන අරමුණු ළඟා කර ගැනීම

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| "වනාන්තර ආරක්ෂා කිරීම හා ප්‍රතිස්ථාපනය කිරීම" සහ "භෞමික පරිසර පද්ධති හා තිරසාරව කළමනාකරණය කරන ලද වනාන්තර ආරක්ෂා කිරීම, ප්‍රතිස්ථාපනය කිරීම හා තිරසර භාවිතය ප්‍රවර්ධනය කිරීම, කාන්තාරකරණයට එරෙහිව කටයුතු කිරීම, ජෛව විවිධත්ව හානිය වැළැක්වීම" වශයෙන් 2020 වර්ෂය සඳහා දෙපාර්තමේන්තුව විසින් හඳුනා ගෙන තිබුණු ප්‍රධාන තිරසාර සංවර්ධන අරමුණු 5 ක් යටතේ 2030 වර්ෂය වන විට වන ආවරණය සියයට 32 ක් දක්වා වැඩි කිරීම ඉලක්ක කර තිබුණි. එහෙත්, වනාන්තර රක්ෂිත ලෙස තහවුරු කිරීමට ප්‍රමාද වීම මත අනවසර ඉඩම් අල්ලා ගැනීම පාලනය කිරීමට නොහැකිවීම, පාරිසරික වශයෙන් ඉතා ඉහළ වටිනාකමකින් යුත් භූමි ප්‍රදේශයන් තුළ කැණීම් සඳහා බලපත්‍ර නිකුත් කිරීම, පවතින කාර්ය මණ්ඩල පුරප්පාඩු සහ ප්‍රමාණවත් පරිදි යටිතල පහසුකම් සැපයීමට | පිළිතුරු ලබා දී නොමැත. | තිරසර සංවර්ධන ඉලක්ක කරා සාර්ථකව ළඟාවීම සඳහා අවශ්‍ය ප්‍රතිකර්ම/ ක්‍රියාමාර්ග ස්ථාපිත කළ යුතුය. |

අපොහොසත්වීම නිසා තිරසර සංවර්ධන ඉලක්ක සපුරා ගැනීමේ දැඩි අභියෝගවලට මුහුණ පෑමේ ප්‍රවණතාවක් පැවතුණි.

## 5. මානව සම්පත් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2023 දෙසැම්බර් 31 දිනට දෙපාර්තමේන්තුවේ 3,229 ක් වූ අනුමත, කාර්ය මණ්ඩලයෙන් 617 ක් පුරප්පාඩු වි පැවති අතර ජොෂ්ඨ මට්මට අයත් නියෝජ්‍ය හා සහකාර වන සංරක්ෂක නිලධාරීන් 49 ක් ද, තෘතියික මට්ටමට අයත් වන පාලක (විශේෂ) හා දිසා වන නිළධාරීන් 26 ක් ද, ද්විතීක මට්ටමට අයත් අඩවි වන නිළධාරීන් 291 දෙනෙකු හා බීට්වු වන නිළධාරීන් 251 දෙනෙක් ද ඒ අතර විය. එම තනතුරු පුරප්පාඩුව ප්‍රාදේශීය කාර්යාලවල කටයුතු කාර්යක්ෂමව ඉටු කර ගැනීම සහ වන අපරාධ වැලැක්වීම කෙරෙහි හා අරමුණු හා ඉලක්කයන් සාක්ෂාත් කර ගැනීම කෙරෙහිත් බලපා ඇති බව නිරීක්ෂණය විය. | සියලු බඳවා ගැනීම් අත්හිටුවා තිබීමෙන් 2019 සිට බඳවා ගැනීම් සිදු කර නොමැත. කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක 02/2020 මගින් ප්‍රාථමික සේවා ගණයේ (PL) තනතුරු සඳහා අවශ්‍ය සේවක පිරිස් බහුකාර්ය සංවර්ධන කාර්ය සාධක බලකා දෙපාර්තමේන්තුව මගින් ලබා ගැනීමට තීරණය කර ඇත. වන ක්ෂේත්‍ර සහකාර (සීමිත) (PL- 2) තනතුරු 20 ක් සඳහා නව බඳවා ගැනීම් සිදු කරන ලදි. | දෙපාර්තමේන්තුවේ කාර්ය සාධනය කෙරෙහි අහිතකර ලෙස බලපාන තනතුරු පුරප්පාඩු පුරවා මෙහෙයුම් කටයුතු කාර්යක්ෂම කළ යුතුය. |